**දමන ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දමන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය PT – 02 යටතේ සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය සභාව විසින් මිලදීගෙන තිබූ රු.14,592,000ක මහන මැෂින් හා උපකරණ තොගයක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පිළිගනිමි. ජර්නල් අංක 4 දරන 2024.05.13 දිනැති ජර්නලය මඟින් මේ වන විට අදාළ වටිනාකම ප්‍රාග්ධනිත කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ග්‍රාමීය ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව පළමු බිල්පතෙහි රැඳවුම් මුදල රු.387,936ක් කර්මාන්ත ණයහිමි යටතේ වැඩියෙන් දක්වා තිබුණි. | එම මුදල ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම් රු.148,575ක් ගිණුම්ගත කර නොතිබුණි. | දැන්වීම් පුවරු සඳහා හිඟහිටි ශේෂයන් ලේඛනගත නොකරන හෙයින් 2023 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුදල ගිණුම්ගත කර නොමැති බව. | හිඟ ආදායම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් පරිත්‍යාග ලෙස ලද මුද්‍රණ යන්ත්‍රයේ (Epson dot printer LQ - 310) වටිනාකම හා සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබූ පුස්තකාල පොත් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. එය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂය තුළ ශුද්ධ මුදල් චලනයට වර්ෂ ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ එකතු කළ පසු වටිනාකම රු.21,514,588ක ඍණ අගයක් වුවත් වර්ෂ අවසාන මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම රු.3,553,365ක් වූයෙන් ඒ අතර රු.25,067,953ක නොසැසඳීමක් පැවතුණි. | පිළිගනිමි. මේ සම්බන්ධව පරීක්ෂා කර අදාළ වරද නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) යන්ත්‍ර හා උපකරණ<br>(ආ) මෝටර් රථ හා කරත්ත<br>(ඇ) ලී බඩු හා සවිකිරීම් | 98,500<br>23,655<br>788,214 | (i) උපලේඛන<br>(ii) ස්ථාවර වත්කම් ලේඛන | 2010ට පෙර සිට ඉදිරියට එන මෙම වටිනාකම සම්බන්ධ තොරතුරු කිසිවක් නොමැති බව. | මූලා ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ)ජරාවාස ගොඩනැගිලි නඩත්තුව<br>(ඉ) හිඟ හිටි අක්කර බදු<br>(ඊ) හිඟ හිටි වෙළඳ බලපත්‍ර<br>(උ) හිඟ හිටි වෙනත් ආදායම්<br>(ඌ)ස්ථිර තැන්පත්වල ඇති සේවක ඇප | 62,468<br>230,850<br>83,750<br>1,415<br>1,456 | (i) උපලේඛන<br>(ii) ලේඛන<br>(iii) ශේෂ සනාථ කිරීම් | - එම - | - එම - |
| (එ) ටෙන්ඩර් තැන්පත්<br>(ඒ) කොන්ත්‍රාත්<br>(ඔ) කරුවන්ගේ තැන්පත් විවිධ තැන්පත් | 482,623<br>1,585,740<br>935,986 | (i) ගෙවිය යුතු පාර්ශවය සහිත උපලේඛන<br>(ii) ශේෂ සනාථ කිරීම් | - එම - | - එම - |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් (EPF) පනත සහ 1980 සේවක භාරකාර අරමුදල් (ETF) පනත | දළ වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් මූලික වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව සේවක අර්ථසාධක අරමුදල් රු.180,744ක් සහ භාරකාර අරමුදල් රු.27,111ක් අඩුවෙන් ගණනය කොට අරමුදල් වෙත මුදල් යවා තිබුණි. | මෙම වරද පිළිගන්නා අතර, 2024 පෙබරවාරි මස සිට මෙය නිවැරදි කර, දළ වැටුප මත පදනම්ව දායක මුදල් අය කරන බව. | පනතේ සඳහන් කර ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති

| | | | | |
|---|---|---|---|---|
| (i) | 5(12) රීතිය | මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ඇප තැන්පත් කිරීම් සම්බන්ධව සුදුසු පරිදි ක්‍රියා කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 32 රීතිය | පී.එස්. 23 ආකෘති පත්‍රය පරිදි වරිපනම් බදු ලේඛනයක් වරිපනම් බදු ගෙවිය යුතු වන සියලුම ගොඩනැගිලි හා ඉඩම් වෙනුවෙන් පවත්වා ගත යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් බදු පරිගණකයේ සටහන් කිරීම පමණක් සිදුකරන අතර ඒ සඳහා ලේඛන භාවිතා කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට PS 23 ආකෘතියට අනුව වරිපනම් ලේඛන පවත්වාගෙන යාමට මේ වන විට කටයුතු කර ඇති බව. | පරිගණක ගත පද්ධතියට සාපේක්ෂව වරිපනම් බදු ලේඛන පවත්වා ගත යුතුය. |
| (iii) | 59 හා 57 රීති | සෑම වර්ෂයක් ආරම්භයේදීම සභාවේ ආදායම් පරීක්ෂක හෝ බලය පවරන ලද්දා වූ නිලධාරියෙකු විසින් සභා බල ප්‍රදේශය තුළ පවතින වෙළෙඳ, ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා අතර ආදායම් පරීක්ෂකවරයෙක් වසර තුනක පමණ කාලයක සිට නොමැතිවීම මෙයට හේතු වූ බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | 218 රීතිය | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඉඩම් ගොඩනැගිලි පරීක්ෂාවක් කිරීමට කටයුතු කර ඇති බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2020 හා 2022 අගෝස්තු 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවක දී රු.100,000ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවත් දමන ප්‍රාදේශීය සභාවේ මාණ්ඩලික නොවන නිලධාරියෙකු වෙත සීමාව ඉක්මවා රු.150,000ක අත්තිකාරම් මුදලක් 2023 ඔක්තෝබර් 10 දින ලබා දී තිබුණි. | පිළිගනිමි. මෙම අත්තිකාරම් මුදල LDSP ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් ලබා දී ඇති බවත්, එය නැවත ප්‍රතිපූර්ණය කර ඇති බවත් වැඩිදුරටත් දන්වා සිටින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිශ්චිත සීමාව තුළ අත්තිකාරම් ලබාදිය යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් උපලේඛන අනුව ගෙවිය යුතු පාර්ශවයන් හඳුනා නොගත් රු.3,004,349ක ටෙන්ඩර්, කොන්ත්‍රාත් හා විවිධ තැන්පත් ශේෂයන් සහ තැන්පත් කළ දින සිට වසර දෙකක කාලය ඉක්ම වූ තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී මෙම ශේෂයන් සම්බන්ධව මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,766,125ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,344,297ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම් | 2023 බිල්කළ ආදායම් | 2023 රැස්කළ ආදායම් | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම් | 2022 බිල්කළ ආදායම් | 2022 රැස්කළ ආදායම් | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 770,900 | 797,578 | 850,683 | 1,746,621 | 720,907 | 815,706 | 494,264 | 1,799,725 |
| ii. | කුලී ආදායම | 4,912,500 | 5,485,829 | 4,709,536 | 2,653,016 | 3,585,000 | 1,914,501 | 854,593 | 1,876,723 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,712,500 | 1,052,900 | 1,052,900 | 83,750 | 1,020,000 | 446,850 | 446,850 | 83,750 |
| iv. | වෙනත් ආදායම් | 1,175,000 | 1,270,523 | 1,270,523 | - | 2,970,400 | 2,544,562 | 2,544,562 | - |
| v. | එකතුව | 8,570,900 | 8,606,830 | 7,883,642 | 4,483,387 | 8,296,307 | 5,721,619 | 4,340,269 | 3,760,198 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු වරිපනම් හිඟය රු.1,515,770ක් වූ අතර එය වාර්ෂික තක්සේරු වටිනාකම වන රු.420,907 මෙන් තුන් ගුණයකට අධික මුදලක් විය. | ආදායම් පරිපාලක තනතුරු 3ක් දැනට වසර තුනකට අධික කාලයක සිට පුරප්පාඩුව පවතී. නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වීමට එය ප්‍රධානතම හේතුව වූ අතර, මෙම වසර තුළදී වැඩ බලන ආදායම් පරීක්ෂකවරයා මඟින්, වරිපනම් බදු රැස් කිරීම වැඩි කිරීමට හා හිඟ වරිපනම් බදු අයකර ගැනීමට අපේක්ෂා කරන බව. | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.2,653,016 ක් වූ අතර එම ශේෂය වසර 01 ක සිට වර්ෂ 03ක වැඩි කාලයක සිට අයකර ගත යුතු ණය ශේෂ 42කින් සමන්විත විය. | ආදායම් පරීක්ෂකවරයෙක් වසර තුනක පමණ කාලයක සිට නොමැතිවීම සෘජුවම බලපෑ බව. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු සියලු කාර්යයන් හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 05 ක් පමණක් පනවා තිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු නීත්‍යානුකූල කර ගත යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා විසින් 2022 මැයි 09 වන දින සභාව සතු කැබ් රථය පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොළඹ පැවති රැස්වීමට සහභාගී වී ආපසු පැමිණීමේ දී කලහකාරී සිද්ධියට මැදි වී කැබ් රථයට පහර දී ගිනි තැබීම හේතුවෙන් කැබ් රථය මුළුමනින්ම හානියට පත් වී තිබූ අතර මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ඉදිරිපත් කළ ප්‍රාරම්භක වාර්තාව අනුව රථයට සිදුව තිබූ අලාභය රු.8,500,000 ක් වුවත් රක්ෂණ වන්දි ලෙස ලද මුදල රු.5,000,000ක් වූයෙන් ප්‍රාදේශීය සභාවට රු.3,500,000ක අලාභයක් සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී කැබ් රථයේ වටිනාකම ද පොත්වලින් ඉවත්කර තිබුණි. | පිළිගනිමි. අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා අනුමැතිය ලබාගෙන වටිනාකම පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් මාසිකව දිරන කසල කිලෝග්‍රෑම් 850ක් සහ නොදිරන කසල කිලෝග්‍රෑම් 150ක් වශයෙන් 2023 වර්ෂයේ දී කසල කිලෝග්‍රෑම් 12,000ක් පමණ ප්‍රමාණයක් රු.6,954,018ක වියදමක් දරා රැස්කර තිබුණු අතර දිරන කසල භාවිතා කර 2023 වර්ෂයේ දී කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 1,641ක් නිෂ්පාදනය කර කිලෝග්‍රෑම් 1,525ක් අලෙවි කිරීම තුළින් රු.30,500ක ආදායමක් පමණක් රැස්කර තිබුණි. | කසල රැස්කිරීමේ වියදම අවම කර, කොම්පෝස්ට් අලෙවිය වැඩිදියුණු කර ආදායම් ඉහළ නැංවීම සඳහා අප විසින් කටයුතු සිදු කරන බව. | කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවිය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |
| (ආ) | සී/ස හිඟුරාණ සීනි සමාගම වෙත අයත්ව තිබූ දේපල ඒකක 186 කට අදාළව දැනට පදිංචිව සිටින නේවාසිකයින් සහ සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම යන දෙපාර්ශවයම විසින් වරිපනම් බදු මුදල් ගෙවනු ලබන බව නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් 2019 සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළව වැඩිපුර ලද රු.180,335ක වරිපනම් බදු ආදායමක් තැන්පත් ගිණුමේ පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව එකම දේපල ඒකක ප්‍රමාණයක් වෙනුවෙන් නීත්‍යානුකූල නොවන ලෙස දෙපාර්ශවයකින් වරිපනම් බදු මුදල් අයකර ගෙන තිබුණි. | නිශ්චිතව තොරතුරක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම නිවාසයන්හි පදිංචිකරුවන්ගෙන් හා සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම යන දෙපාර්ශවයෙන්ම වරිපනම් අය කර ගැනීම් සිදුව ඇත. 2024 වසර තුළදී නව තක්සේරුව ලැබීමෙන් පසු හෝ එම දෝෂය නිවැරදි කර ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරන බව. | අයකළ යුතු පාර්ශවය නිවැරදිව හඳුනාගෙන බදු අයකළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ දී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් දේපල මත 2007 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අයකර තිබූ අතර කාලීනව එම දේපල තක්සේරු කර ඒ මත වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ඉල්ලුම් කර ඇති අතර, ඒ සඳහා අදාළ සේවා ගාස්තු ද මේ වන විට අප විසින් ගෙවා අවසන් කර ඇති බව. | කාලීනව තක්සේරු කර බදු මුදල් අයකළ යුතුය. |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතුව භාවිත කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 09ක් සුදුසු පරිදි අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාවිතා කළ නොහැකි තත්වයේ පවතින වාහන සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරන බව. | සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් සුසාන භූමි 27ක, ක්‍රීඩා පිටි 10ක හා සභාවට අයත් ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරුවක් කර නොමැති බැවින් වටිනාකමක් හඳුනාගැනීමට නොහැක. ඉදිරියේ දී ඒ සම්බන්ධව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාව සතු මෝටර් රථ හා කරත්ත අයිතම 05ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වාහන අයිතමවල වටිනාකම පිළිබඳ කිසිඳු ලේඛනයක් සභාව සතුව නොමැති බව. | - එම - |
| (ඇ) | සභාව සතු අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින බැකෝ ලෝඩරය 2022 පෙබරවාරි 19 දින සිට නිෂ්කාර්යව පැවතුණි. | සභාවේ ආදායම් තත්වය අනුව ඉදිරියේදී අලුත්වැඩියා කර, භාවිතා කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් අලුත්වැඩියා කර භාවිතා කළ යුතුය. |
| (ඇ) | සභාව භාරයේ පවතින වාහන 09ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන අයිතිය පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | LDSP (PT – 02) ව්‍යාපෘතිය යටතේ ඇඟලුම් කර්මාන්ත ශාලා දෙකක් පවත්වා ගැනීම සඳහා ආයතනයක් තෝරා පත්කර ගැනීමේ දී ඒ සඳහා සුදුසුකම් සහිත පාර්ශවයන් සහිත කමිටුවක් මඟින් තීරණ නොගෙන සහ පෞද්ගලික ආයතනයේ කාර්යසාධනය පිළිබඳ කිසිදු ඇගයීමක් සිදු නොකොට රුපියල් මිලියන 17.3ක වියදමක් දරා ආරම්භ කිරීමට නියමිත මෙම ඇඟළුම් කම්හල් සඳහා පෞද්ගලික ආයතනයක් නිතරගයෙන් තෝරා පත්කර ගෙන තිබුණි. | ආයතන 05කින් එක් ආයතනයක් පමණක් පැමිණ සාකච්ඡා කරන ලදී. තෝරාගත් ආයතනයේ ප්‍රධාන මැහුම් හල ගරු සභාපති විසින් නිරීක්ෂණය කළ බවත් සභාපතිතුමාගෙන් ලද උපදෙස් අනුව අදාළ ආයතනය තෝරා ගත් බව. | ආයතන කිහිපයක් පිළිබඳ ඇගයීම් සිදුකර තරඟකාරී ආයතනයක් තෝරාගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අංක PL/LDSP/4/3(Gen.File) හා 2023 ජනවාරි 31 දිනැති ලිපියේ 3.2 ප්‍රකාරව මිල ගණන් කැඳවීමේ සීමාව රුපියල් මිලියන 18 දක්වා වූ ව්‍යාපෘතිවලට අදාළව ප්‍රසම්පාදන මණ්ඩලයේ සංයුතිය ලෙස පළාත්පාලන කොමසාරිස්තුමාගේ සභාපතිත්වයෙන් හා අදාළ පළාත් පාලන ආයතනයේ සභාපති හෝ ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නියෝජිතයෙක් හා අවශ්‍ය යැයි හැඟෙන වෙනත් නිලධාරියෙක් පත්කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් රු.14,892,000ක් වූ භාණ්ඩ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කමිටු සංයුතිය වෙනස් කර ගැනීමේ අරමුණින් ආරම්භ කිරීමට නියමිත මධ්‍යස්ථාන දෙක සඳහා වෙන වෙනම ප්‍රසම්පාදන ලේඛන සකස් කර රුපියල් මිලියන 9 සීමාව යටතේ 3.1 ප්‍රකාරව පළාත් පාලන ආයතනයේ ලේකම්ගේ සභාපතීත්වයෙන් යුත් ප්‍රසම්පාදන කමිටුවක් තෝරා පත් කරගෙන මහන මැෂින් හා උපකරණ මිලදීගැනීම සිදුකර තිබුණි. | අප විසින් මැහුම් හල් 02ක් ස්ථාන 02ක පවත්වා ගෙන යාමට සැලසුම් කර තිබුණි. ඒ අනුව ස්ථාන දෙකකට වෙන වෙනම මිල ගණන් කැඳවනු ලැබීය. හිඟුරාණ හා මඩවලලන්ද ලෙස මධ්‍යස්ථාන දෙකක් ආරම්භ කිරීමට මුලින් සැලසුම් කළද මඩවලලන්ද මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල අලුත්වැඩියාව සඳහා ව්‍යාපෘතියෙන් වෙන් වූ මුදල ප්‍රමාණවත් නොවන බැවින් හිඟුරාණ සභාවට අයත් පැරණි ගොඩනැගිලි දෙක නවීකරණය කර එහි මධ්‍යස්ථාන දෙකම පවත්වාගෙන යාමට සැලසුම් කළ බව. | ඇඟලුම් කම්හල් දෙක සඳහා එකම වර්ගයේ භාණ්ඩ මිලදීගන්නා බැවින් එක් ප්‍රසම්පාදන කටයුත්තක් සේ සලකා කටයුතු කළ යුතුය. |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | 2023 ජුනි 26 දින ප්‍රාදේශීය සභාව වෙත ගෙනැවිත් භාර දී තිබූ භාණ්ඩ අම්පාර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු, ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරි, විෂයභාර නිලධාරි සහ ප්‍රාදේශීය සභාවේ ලේකම් යන පාර්ශවයන් විසින් එම භාණ්ඩ නියමිත පිරිවිතරයන්ට අනුව ලැබී ඇති බව සහතික කරමින් භාරගෙන තිබුණි. මහන මැෂින් සම්බන්ධව සහ ඇගළුම් කර්මාන්තශාලා සම්බන්ධව දැනුමැති පාර්ශවයක් තාක්ෂණික ඇගයීම් කමිටුව තුළ ඇතුළත් නොවීම හේතුවෙන් මෙම භාණ්ඩ නියමිත පිරිවිතරයන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීමකින් | භාණ්ඩ සපයනු ලැබූ ආයතනයේ කාර්මික නිලධාරියෙකු භාණ්ඩ භාරදෙන අවස්ථාවේ භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා පැමිණි අතර, අප විසින් ඒ සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවකු ද සම්බන්ධ කරගත් බව. | භාණ්ඩ භාරගැනීමේ කමිටුවට මහන මැෂින් හා උපකරණ පිළිබඳව දැනුමැති පාර්ශවයක් ඇතුළත් කළ යුතුය. |

තොරව භාර ගැනීම හේතුවෙන් මිලදීගත් භාණ්ඩවල පහත සඳහන් අඩුපාඩු පැවතුණි.

| | | |
|---|---|---|
| ❖ මැෂින් 18 ක් වර්ණ ඡායාරූප මඟින් ඉදිරිපත් කරන ලද මාදිලියට වඩා වෙනස් මාදිලියන්ට අයත්ව තිබුණි. | 5THD මැෂින් එකට අදාල පිරිවිතර සහිත මැෂින් එකක් එවා ඇති බව, 4THD හා සමාන පිරිවිතරයට අදාළ මැෂිමක් ලබා දී ඇති බව, Button Attacher ඉල්ලා ඇති මැෂින් එක පැරණි මාදිලියේ මැෂින් එකකි. ආයතනය විසින් ලබා දී ඇත්තේ නව මාදිලියේ මැෂින් එකක් බව, Button Hole Machine ඉල්ලා ඇත්තේ පැරණි මාදිලියේ මැෂිමකි. ලබා දී ඇත්තේ කාර්යක්ෂමතාව වැඩි මැෂිමක් බව හා Mini Boiler මැෂින් දෙකෙන් සිදු වන ක්‍රියාවලිය එක හා සමාන බව. | භාණ්ඩ සැපයීමේ දී ප්‍රසම්පාදන තීරණ සමඟ වෙනස්කම් සිදු වන්නේ නම් සැපයුම්කරු විසින් අදාළ ආයතනය දැනුවත් කර ඒ සඳහා පූර්ව එකඟතාව ලබා ගත යුතුය. |
| ❖ එකක් රු.670,000 බැගින් මිලදීගෙන තිබූ Flatlock Hem Cutter Machine දෙකෙන් එකක් භාවිතා කරන ලද පැරණි මැෂිමක් වූ අතර සැපයුම්කරු සපයන ලද වර්ග 02කට අයත් මැෂින් දෙකක් එකම මිලකට ලබාගෙන තිබුණි. | මේ සම්බන්ධව මැෂින් මිලදී ගත් ආයතනය විසින් ප්‍රකාශ කරනු ලැබුවේ අප විසින් සතියක් ඇතුළත අදාළ භාණ්ඩය ඉල්ලා සිටි බවත් ඒ වන විට ආයතනයේ ප්‍රදර්ශනාගාරයේ තිබූ භාණ්ඩ ලබා දුන් බව. | ප්‍රසම්පාදන තීරණවලට අනුකූලව මිලදීගැනීම් සිදුකළ යුතුය. |
| ❖ රු.1,000,000ක් වියදම් කර භාවිතා කරන ලද පැරණි Smoking machine එකක් මිලදීගෙන තිබුණි. | මෙම මැෂින් එක භාවිතා නොකරන ලද මැෂිමක් බවත් එය මව් ශාඛාවෙන්ම පරීක්ෂා කිරීම සඳහා නූල් දමා එවා ඇති බවත් භාණ්ඩ මිලදී ගත් ආයතන සඳහන් කළ බව. | භාණ්ඩ සභාව වෙත භාර ගැනීමේදී ඒවායේ ගුණත්වය පිළිබඳව පරීක්ෂා කර භාරගත යුතුය. |
| ❖ එකක් රු.400,000 බැගින් මිලදීගෙන තිබූ Mini boilers දෙකෙන් එක් යන්ත්‍රයක් භාවිතා කරන ලද පැරණි යන්ත්‍රයක් වූ අතර මිලදීගෙන තිබූ යන්ත්‍ර දෙක එකිනෙකට වෙනස් මාදිලි දෙකකට අයත් යන්ත්‍ර විය. | පැරණි යන්ත්‍රයක් නොව අලුත් යන්ත්‍රයක් බව භාණ්ඩ මිල දී ගත් ආයතනය සඳහන් කළ බව. | පාවිච්චි කරන ලද භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීමට කටයුතු නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ❖ රු.340,000ක් වටිනා Iron Table 02ක් මිලදීගෙන තිබූ අතර ඉන් එකක් සවිකර භාර දී තිබුණු අතර එය භාවිතා කරන ලද Iron Table එකක් විය. | Iron Table අදාළ ආයතනය විසින් ලබා දෙනු ලබන්නේ සවි කිරීමෙන් පසුව බව. | - එම - |
| | ❖ Steam Iron 06 ක් මිලදීගැනීම සඳහා රු.117,000 ක මුදලක් ගෙවා තිබුණ ද භෞතික පරීක්ෂාවේ දී Steam Iron 04 ක් පමණක් පවතින බව නිරීක්ෂණය වූයෙන් සභාවට රු.39,000 ක අලාභයක් සිදුව තිබුණි. | Steam Iron 06ක් සඳහා බිල්කර ඇති හෙයින්, ඉතිරි Steam Iron 02 හි Steam කොටස් 2 අප වෙත ලබා දීමට අදාළ භාණ්ඩ මිලදී ගත් ආයතනය විසින් එකඟ වී ඇති බව. | භාරගත් භාණ්ඩවලට පමණක් ගෙවීම් සිදුකළ යුතුය. |
| | ❖ LDSP ව්‍යාපෘතිය යටතේ 2023 ජුනි 22 දින කාර්තිව් ප්‍රාදේශීය සභාව මගින් පරිගණක පුටුවක් රු.14,500කට මිලදීගෙන තිබුණු අතර දමන ප්‍රාදේශීය සභාව මගින් එම වර්ගයේම පුටු 46ක් එකක් රු.20,000 බැගින් ඉහතින් සඳහන් පෞද්ගලික ආයතනයෙන් ලබාගෙන තිබුණි. මේ අනුව එකම කාල සීමාවක විශාල මිල වෙනසක් සහිතව මිලදීගැනීම හේතුවෙන් දමන ප්‍රාදේශීය සභාවට රු.253,000ක අලාභයක් සිදුව තිබුණි. | මහන මැෂින් හා ඒ සඳහා භාවිතා කරන මේස හා පුටු එකම ආයතනයකින් ලබා ගැනීම, ඇඟලුම් කම්හල පවත්වාගෙන යන්නන් හට වඩාත් පහසු වන හෙයින් එසේ සිදුකළ බව. | මිල පිළිබඳව සලකා බලා මිලදීගැනීම් සිදුකළ යුතුය. |
| (ii) | 2023 ජුනි 26 දින උක්ත භාණ්ඩ තොගය ප්‍රාදේශීය සභාව වෙත එක් වාහනයකින් ගෙනැවිත් භාර දී තිබුණි. මෙලෙස එක් වාහනයකින් භාණ්ඩ ප්‍රවාහනය කර තිබිය දී මධ්‍යස්ථාන දෙක සඳහා භාණ්ඩ ප්‍රවාහන වියදම් ලෙස රු.300,000ක් ගෙවීම් කිරීම හේතුවෙන් රු.150,000ක මුදලක් ප්‍රවාහන වියදම් ලෙස වැඩිපුර ගෙවා තිබුණි. | මිල ගණන් ඉදිරිපත් කිරීමේදී මධ්‍යස්ථාන දෙක සඳහා වෙන වෙනම භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවන ලදී. ඒ අනුව මධ්‍යස්ථාන දෙකේම භාණ්ඩ ප්‍රවාහනය සඳහා මිළ ගණන් වෙන වෙනම ඉදිරිපත් කළ අතර ඒ අනුව මධ්‍යස්ථාන දෙක සඳහාම භාණ්ඩ ප්‍රවාහනයට වෙන වෙනම ගෙවීම් කර ඇති බව. | එකම වාහනයකින් භාණ්ඩ ප්‍රවාහනය කර තිබීම හේතුවෙන් ප්‍රවාහන කුලී දෙවරක් නොගෙවිය යුතුය. |
| (iii) | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල නවීකරණය සඳහා ප්‍රතිපාදන මුදල් මේ වන තෙක් නොලැබීම හේතුවෙන් මිලදීගත් භාණ්ඩ තොගය නිෂ්කාර්යව ගබඩා කර පවතින අතර, භාවිතා නොකර තිබිය දී ඒවායේ වගකීම් කාලයෙන් මාස 08 ක් මේ වන විට ඉක්මවා ගොස් තිබුණි. | මෙම ව්‍යාපෘතියේ අදියර - I යටතේ භාණ්ඩ ලබා ගැනීමටත් අදියර - II යටතේ ගොඩනැගිල්ල අලුත් වැඩියාවටත් අනුමත කර ඇත. එම මැෂින් සඳහා භාණ්ඩ සැපයූ ආයතනයෙන් මහන මැෂින් ස්ථාපිත කිරීමෙන් පසු මාස 06ක වගකීම් කාලයක් ලබා දීම සිදු කරන බව. | ගොඩනැගිල්ල නවීකරණය කර මහන මැෂින් හා උපකරණ කඩිනමින් භාවිතා කළ යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රාදේශීය සභාවේ තනතුරු 18ක් පුරප්පාඩුව පැවතුණි. | එම පුරප්පාඩු පියවීම සඳහා අවස්ථා කිහිපයකදීම අප ඉල්ලීම් කර ඇතත්, මේ වන තෙක් පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්තයක් සිදු වී නොමැති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණ ද එය සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි විධිමත්ව සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සකස් කර ඇති බව. | පනත ප්‍රකාරව ආයතනික මෙහෙයුම් ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන කමිටු ස්ථාපිත කර ඇති අතර, කමිටු රැස්වීම් පැවැත්වීමටද කටයුතු කරන බව. | විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කර රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේ දී කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවලදී තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම සම්බන්ධව දැඩි අවධානයක් යොමුකර කටයුතු කරන බව. | තිරසර සංවර්ධනය පිළිබඳ දර්ශකයන් ස්ථාපිත කර ඒවායේ ක්‍රියාකාරීත්වය ඇගයිය යුතුය. |